## Covide 19 - සති පාසල (සබරගමුව)

9 ශ්‍රේණිය (සිව්වන සතිය)

නිපුණතාව 1.0 - සංගීතයේ මූලිකාංග, ශිල්පාංග සහ සිද්ධාන්ත හඳුනා ගනිමින් ගායන/වාදන හැකියා ප්‍රදර්ශනය කරයි.

නිපුණතා මට්ටම 1.1 - ආරෝහණයේ සහ අවරෝහණයේ විවිධ ස්වර ඇතුළත් රාග හඳුනා ගනිමින් ගායන හැකියා වර්ධනය කර ගනියි.

ක්‍රියාකාරකම 1.1.1 - භූපාලි රාගයේ මධ්‍යලය ගීතය

කාලය - විනාඩි 40

ඉහත 1.1.1 ක්‍රියාකාරකමට අදාළව ඔබට සපයා ඇති පහත අංක 01, 02, 03 පැවරුම් සම්පූර්ණ කරන්න.

**පැවරුම අංක 01 - (ලිඛිත)**

1. රාගධාරී සංගීතය පිළිබඳව ඔබ පෙර උගත් දැනුමින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. පහත දැක්වෙන්නේ බිලාවල් සහ භූපාලි රාගයනට අයත් ස්වර ඛණ්ඩ කිහිපයකි. ඒවා වෙන් කොට පහත වගුවේ ලියා දක්වන්න. (සධ,සරිග/මගමරි සරිස/ගපධස'/ස-ධප ගපධස/ගරිගප /ගපධනිස')

| බිලාවල් රාගය | භූපාලි රාගය |
|---|---|
| | |

II. සියලු ම ස්වර ශුද්ධ ව යෙදෙන සම්පූර්ණ ජාති රාගය නම් කරන්න.

III. සරිගරිස,සරිගපගරිස, යන ස්වර අභ්‍යාසය භූපාලි රාගයට අදාළ ව උච්ච සඩ්ජය දක්වා වර්ධනය කරමින් ලියා දක්වන්න.(විනාඩි 20)

**පැවරුම් අංක 02**

1. භූපාලි රාගයට අදාළ මධ්‍යලය ගීතයේ ස්ථායි කොටස ගායනයට/වාදනයට හුරු වන්න.(විනාඩි 20)

ස්ථායි ස' ස' ධ ප / ග රි ස රි/ ධ ධ ස රි / ග රි ග

න ම ක ක / ර ච තු ර/ ශී රි ගු රු/ ච ර ණා -

ග ග ප ධ / ස' ධ ස ස/ ස' ප ධ ප / ග රි ස ජ්

ත න ම න/ නි ර ම ල / ක ර හ ච /ත ර ණා -

11. මෙම ගීතයේ අන්තරා කොටස අන්තර්ජාලය ඔස්සේ ශ්‍රවණය කරන්න. ස්වර ප්‍රස්තාර සහිත ව මීළග සති පාසලෙන් ඔබට ඉදිරිපත් කරනු ලැබේ.

**පැවරුම් අංක 03 (පසු වැඩ)**

I. අන්තර්ජාලය ඔස්සේ භූපාලි රාගයට අයත් ශාස්ත්‍රිය ගායන/වාදන හැකිතාක් ශ්‍රවණය කරන්න. (මධ්‍යලය ගී- බැබලේ පුරහඳ, ජබසේ තුමසන ලාගලි, ඉතනොජො බන පර)